**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

| 2021 අප්‍රේල් 09 | **මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන** | **2021 අංක 04** |
|---|---|---|

## විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම්

| | | | |
|---|---|---|---|
| 1. | නීති ප්‍රතිපාදන | 1.1 | 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් විදේශ මුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් මෙම විධාන නිකුත් කරනු ලබයි. |
| 2. | විධානයන්හි අරමුණු | 2.1 | බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය විදේශීය අරමුදල් සඳහා නිරාවරණය වීම තුළින් රට තුළ පවතින අනවශ්‍ය සාර්ව ආර්ථික හා මූල්‍ය අංශයේ අස්ථාවරභාවයන් ස්ථාවර කිරීම. |
| | | 2.2 | විදේශීය අරමුදල් සඳහා නිරාවරණය වීම පිළිබඳ අවදානම් කළමනාකරණ රාමුවක් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා සැපයීම. |
| 3. | අදාළත්වය සහ විෂය පථය | 3.1 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගනු ලබන සියලුම විදේශ මුදල් ණය සඳහා මෙම විධාන අදාළ වේ. |
| 4. | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම | 4.1 | තාර්කික තක්සේරුව, ණය ගැනීමේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ භාවිතයන් තිබීම තක්සේරු කිරීමෙන් අනතුරුව බලපත්‍රලාභී මුදල් සමාගම්වල සියලුම විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. |
| | | 4.2 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විචක්ෂණශීලී විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතුය. |
| 5. | කාලසීමාව | 5.1 | විදේශ ණය මුදල් හි කල්පිරීමේ කාලසීමාව අවුරුදු 2 ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| 6. | විදේශ මුදල් ණයට ගැනීමේ සීමාවන් | 6.1 | බලපත්‍රලාභී මුදල් සමාගමේ නිශ්චිත කාලසීමාවක දී ගෙවීමට ඇති විදේශ විනිමය ණය ප්‍රමාණය එම සමාගමේ මුළු වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස නිර්ණය කෙරේ. |
| | | 6.2 | බලපත්‍රලාභී මුදල් සමාගමෙහි විදේශ විනිමය ණය ගැනීමේ ප්‍රතිශතය පහත අංක 1 වගුවෙහි දක්වා ඇති එක් එක් මට්ටම සඳහා ලබා දී ඇති නිර්ණායක මත පදනම් විය යුතුය. |

**වගු අංක 1 : විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමේ සීමාවන්, නිර්ණායක සහ අවශ්‍ය අනුමැතීන්**

| **ස්ථරය** | **නිර්ණායක** | **විදේශ ව්‍යවහාර ණය මුදල් සීමාව මුළු වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස** | **අවශ්‍ය අනුමැතීන්** |
|---|---|---|---|
| 1 | ණය ලබා ගැනීමේ දී 8.2 වගන්තියෙහි දක්වා ඇති විචක්ෂණශීලී අවශ්‍යතා සපුරාලන බලපත්‍රලාභී මුදල් සමාගම් | 10.0 | ණය මුදල් ලබා ගැනීමට පෙර සහ පසු අධ්‍යක්ෂවරයාට දැනුම් දීම |
| 2 | i. 1 වන ස්ථරයේ නිර්ණායක සපුරා තිබීම<br>ii. අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට අමතරව සියයට 1 ක ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම, සහ<br>iii. ප්‍රකාශයට පත් කළ හැකි ණය ශ්‍රේණිගත කිරීමෙහි ආයෝජන ශ්‍රේණිය (බීබීබී) සහ ඊට ඉහළ අගයක් පැවතීම | 10.0 ට වැඩි - 15.0 | අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය |
| 3 | i. 2 වන ස්ථරයේ නිර්ණායක සපුරා තිබීම<br>ii. එවැනි ණය ගැනීම් සුරැකුමක් රහිත සහ තැන්පත්කරුවන්ගේ හිමිකම් වලට වඩා පහළ අගයක් විය යුතු සහ<br>iii. අපනයන අරමුණු සඳහා, ආනයන ආදේශන, රජයේ සංවර්ධන ව්‍යාපෘති, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, විදේශ ආදායම් උත්පාදන ව්‍යාපෘති, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම අංශයක් ප්‍රමුඛතා අංශයන් | | |

| | | | |
|---|---|---|---|
| | සඳහා ණය ලබාදීම/ආයෝජනය කිරීම සඳහා එවැනි ණය ගැනීම් සම්පූර්ණයෙන්ම යෙදවිය යුතුය. 15.0 ට වැඩි - 20.0 මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය | | |

7\. අනුමැතිය සඳහා අවශ්‍යතා

7.1 ඉහත 6 වන වගන්තියේ දක්වා ඇති පරිදි විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් සඳහා දැනුම් දීමේ දී හෝ අනුමැතිය ලබා ගැනීමේ දී ඕනෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

i. 1 වන ස්ථරය

අ. බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂා කරන විදේශ ව්‍යවහාර මුදල් ණය පිළිබඳ අදාළ අනෙකුත් විස්තර ණය පහසුකම ලබා ගැනීමට පෙර අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කිරීම.

ආ. විදේශ මුදල් ණය ලබා ගැනීමෙන් අනතුරුව වැඩ කරන දින 3 ක් ඇතුළත ඒ පිළිබඳ විස්තර සහ බැංකු තහවුරු කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම.

ii. 2 වන ස්ථරය - බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂිත විදේශ ව්‍යවහාර මුදල් ණය පිළිබඳ වෙනත් අදාළ විස්තර ඉදිරිපත් කිරීමෙන් අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම.

iii. 3 වන ස්ථරය - බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂිත විදේශ ව්‍යවහාර මුදල් ණය පිළිබඳ වෙනත් අදාළ විස්තර ඉදිරිපත් කිරීමෙන් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම.

7.2 අධ්‍යක්ෂවරයා හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම්, අනුමත කළ දින සිට මාස 3 ක් ඇතුළත ලබා ගත යුතුය.

8\. අනෙකුත් නියමයන් සහ කොන්දේසි

8.1 බලපත්‍රලාභී මුදල් සමාගම්වල විදේශ ව්‍යවහාර මුදල් ණයට ගැනීම්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අදාළ විධිවිධාන හා ඒ යටතේ නිකුත් කර ඇති විධාන/රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

8.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන්, අවම මූලික ප්‍රාග්ධනය සහ ද්‍රවශීල වත්කම් ඇතුළු විධානයන් ද ඇතුළත්ව නමුත් එම විධානවලට පමණක් සීමා නොවී විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

8.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ණය භාවිත කළ යුත්තේ ප්‍රතිපාර්ශවය සමඟ ණය ගිවිසුමේ දක්වා ඇති අරමුණු සඳහා පමණි.

## මුදල් මණ්ඩලය
## ශ්‍රී ලංකා මහ බැංකුව



8.4 බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ විනිමය හුවමාරු පහසුකම් සඳහා පවතින මාර්ගෝපදේශයන්ට අනුකූලව විනිමය හුවමාරු පහසුකම් යොදා ගනිමින් විදේශ ව්‍යවහාර මුදල් ණයෙහි පවතින විදේශ විනිමය අවදානම වැළැක්වීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කටයුතු කළ යුතුය. තවද, සුදුසු වෙළඳපොල ව්‍යුත්පන්න උපකරණ භාවිතා කිරීමෙන් සහ එවැනි විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමෙන් ඇති වන පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීමෙන් පොලී ගෙවීමේදී ඇතිවන විදේශ විනිමය අවදානම සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදවිය යුතුය.

8.5 පොලී අනුපාතය, අවදානම ආවරණ පිරිවැය සහ ණය ගැනීමේ සියලු අදාළ පිරිවැය ඇතුළුව මුළු ණය ගැනීමේ පිරිවැය තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි සහ ඒ සඳහා වන ඕනෑම සංශෝධනයක දක්වා ඇති ණය උපකරණ සඳහා නියම කර ඇති පොලී අනුපාතයන්හි උපරිම සීමාවට වඩා අඩු විය යුතුය.

9. සංක්‍රාමී සැලසීම්

විදේශ ව්‍යවහාර මුදල් ණය ලබාගෙන ඇති ඕනෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් මෙම විධානයන් නිකුත් කළ දිනය වන විට විධානයේ සඳහන් උපරිම සීමාවන් ඉක්මවා ඇති නම් ඉහත 6 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි දැනට පවතින විධිවිධාන වලට අනුව සේවා සැපයීමට අවසර දෙනු ඇත.

10. අර්ථ නිරූපණයන්

10.1 'විදේශ ව්‍යවහාර මුදල්' යන්නෙන් අදහස් කරන්නේ ඕනෑම නම් කළ විදේශ මුදල් ය.

10.2 'අධ්‍යක්ෂ'යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

10.3 'මුළු වත්කම්' යන්න බලපත්‍රලාභී මුදල් සමාගමෙහි බාහිර විගණක විසින් සහතික කරන ලද නවතම වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හෝ අතුරු මූල්‍ය ප්‍රකාශනවලට අනුව වත්කම් ප්‍රමාණය වේ.

**මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති